# රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

## ජනමාධ්‍ය පර්යේෂණ හා සන්නිවේදන අංශය

ලිපිනය : 163. කිරුළපන මාවත. කොළඹ 05 | දුරකථන : +94 112 512 749 | විද්‍යුත් තැපැල් : govinformediaresearch@gmail.com


ප්‍රධාන කතෘ/ප්‍රවෘත්ති කතෘ
අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති)/ප්‍රවෘත්ති කළමනාකරු

## ප්‍රවෘත්ති නිවේදනය

පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධන ජාතික වැඩසටහන යටතේ පාසල් මාධ්‍ය සමාජ සඳහා සන්නිවේදන පොත් කට්ටලය බෙදා දීම, කෘතිම බුද්ධිය සහ ජනමාධ්‍යකරණය වැඩමුළුව 2024.07.18 දින පෙ.ව. 9.00 රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදී පැවැත්වේ............

අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මෙහෙයවන පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධන ජාතික වැඩසටහන යටතේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පාසල් මාධ්‍ය සමාජ වෙනුවෙන් සන්නිවේදන පොත් කට්ටල බෙදා දීම සහ පාසල් මාධ්‍ය ගුරුවරුන්ගේ සන්නිවේදන දැනුම යාවත්කාලීන කිරීම ඉලක්ක කර පැවැත්වෙන කෘතිම බුද්ධිය සහ ජනමාධ්‍යකරණය පිළිබඳව එක්දින වැඩමුළුව 2024.07.18 දින පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

මෙහිදි කෘතිම බුද්ධිය සහ ජනමාධ්‍යකරණය පිළිබඳව පාසල් මාධ්‍ය සමාජ ගුරුවරුන් සහ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය උගන්වන ගුරුවරුන් 135 දෙනෙකු දිවයිනේ දිස්ත්‍රික් 15ක් නියෝජනය කරමින් තෝරාගෙන ඇති අතර, මෙම වැඩමුළුව කෘතිම බුද්ධිය සහ ජනමාධ්‍යකරණය පිළිබඳ දේශනය( AFP ) ප්‍රංශ පුවත්පතෙහි ශ්‍රී ලංකා නියෝජිත හර්ෂණ තුෂාර සිල්වා මහතා විසින් සිදු කරනු ඇත.

අන්තර්ජාල හා පරිගනක අපරාධ, (Facebook) සමාජ මාධ්‍යවලින් සිදු කරන විෂමාචාර සහ වෙනත් අක්‍රමිකතා පිළිබඳව පැවැත්වෙන විශේෂ දේශනය (TRC) විදුලි සංදේශ හා නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මේනකා පතිරණ විසින් සිදු කරනු ඇත.

ජනමාධ්‍ය වැඩමුළුවේ විද්වත් කතිකාව සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ, ශ්‍රීපාලි මණ්ඩපයේ ජනමාධ්‍ය අධ්‍යයන අංශයේ මහාචාර්ය ටියුඩර් වීරසිංහ මහතා, මහාචාර්ය ධර්ම කිර්ති ශ්‍රී රංජන් මහතා,කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ ආචාර්ය අරුණ ලොකුලියන මහතා, ප්‍රවීන මාධ්‍යවේදී වරුණ සංජීව මහතා, ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාවේ අධ්‍යක්ෂ (ඉංග්‍රිසි) ප්‍රවෘත්ති ප්‍රසාද් දොඩංගොඩ මහතා,මහාචාර්ය කමල් වලේබොඩ මහතා යන ආචාර්යවරුන් සහභාගිවන අතර ජනාධිපති අතිරේක ලේකම් රෝෂිණී පිරිස් මහත්මිය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් දිනිත් චින්තක කරුණාරත්න මහතා,කොළඹ විශ්වවිද්‍යාලයේ, ශ්‍රීපාලි මණ්ඩපයේ මණ්ඩපාධිපති,මහාචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතා යන මහත්ම මහත්මීන් මෙම වැඩසටහන සඳහා විශේෂ ආරාධිතයින් ලෙස සහභාගිවන බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පවසයි.

ජනමාධ්‍ය පර්යේෂණ අංශය
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
2024.07.16